ARTS කරලා මෙඩිකල් කොලේජ් යන්න බැරිද?
බැරි නෑ දැන් ආර්ට්ස් කරන ඔයාලටත් කලා උපාධිය වෙනුවට විද්‍යාවේදී උපාධියක් ලබා ගන්න පුළුවනී
එතකොට කොහොමද ආර්ට්ස් කරපු අපි ඩොක්ටර්ස්ලා වෙන්නේ?
මෙම උපාධිය කලා කරන ලද දරුවන්ට විශේෂ පදනමක් මත ලබා දෙන්න උපාධි පාඨමාලාවකී සාමාන්‍ය විද්‍යාවේදී උපාධියක් නොවන මෙය විද්‍යාවේදී විශේෂ (කථන හා ශ්‍රවණ විද්‍යා ) (Speech & Hearing Sciences) උපාධිය වේ
අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව□ භෞතික විද්‍යා ව විෂය ධාරාව හෝ කලා විෂය ධාරාවේ කොන්දේසි වලට යටත් ව තෝරාගනු ලබන ඕනෑම අනුමත විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබීම ප්‍රමාණවත් බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වසරක් පාසා නිකුත් කරන විශ්වවිද්‍යාල පාඨමාලා ඇතුලත් ග්‍රන්ථයෙහි සඳහන් වේ එහි දක්වන ලෙස ෆ කලා විෂය ධාරාවේ කොන්දේසි වලට යටත් ව ෆ යනුවෙන් පැහැදිලි ලෙස වෙන් කොට පෙන්වා දි ඇත්තේ කලා විෂය ධාරාවේ විෂයන් අතරින් අනිවාර්යයෙන් අවම ලෙස එක් හර විෂයක් හෝ කර තිබීම අත්‍යවශ්‍ය බවයි
( ඔබට හැදෑරිය හැකි හර විෂයයන් /සමාජීය විද්‍යා විෂයයන් සඳහා නිදසුන්(
ආර්ථික විද්‍යාව / භූගෝල විද්‍යාව / ඉතිහාසය / ගෘහ ආර්ථික විද්‍යාව / කෘෂි විද්‍යාව / ගණිතය / සංයුක්ත ගණිතය / සන්නිවේදන හා මාධ්‍ය අධයනය / ගිණුම්කරණය / දේශපාලන විද්‍යාව / තර්ක ශාස්ත්‍රය / තොරතුරු සන්නිවේදන තාක්ෂණය )
මෙම උපාධිය සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පමණක් ඔබට මෙම කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව හැදෑරීමට අවස්ථාව නොලැබෙන අතර ඒ සඳහා ඒ සඳහා පාඨමාලාව පවත්වන විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුයි ඒ අනුව කැළණි විශ්වවිද්‍යාල පුවත්පත් නිවේදනයක් මගින් එම යෝග්‍යතා පරීක්ෂණය පිළිබඳව දැනුම් දෙනු ලැබේ
මෙම විද්‍යාවේදී උපාධි පාඨමාලාව දැනට ලංකාවේ විශ්වවිද්‍යාල අතරින් පවත්වනු ලබන්නේ කැළණි විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පමණී වෙනත් කිසිදු විද්‍යාපීඨයක හෝ විශ්වවිද්‍යාලයක මෙම පාඨමාලාව අධ්‍යයනය කළ නොහැකි එමෙන් ම මේ සඳහා දැනට එනම් 2017/2018 අධ්‍යයන වර්ශ සඳහා යෝජිත ප්‍රවේශ සංඛ්‍යාව වන්නේ 50කි ඒ අනුව වසරකට මෙම උපාධිය සම්පූර්ණ කොට කියා අපේක්ෂිත උපාධිධාරීන් 50ක් වැනි සීමිත පිරිසක් විශ්වවිද්‍යාලයෙන් පිට වීම කියා අර්බුදයක් ඇති නොවීමට හේතුවකි මෙම කථන හා ශ්‍රවණ විද්‍යා උපාධි පාඨමාලාව වසර හතරක පාඨමාලාවක් වන අතර මෙය හැදෑරිය හැකි මාධ්‍යය වන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණී මෙම උපාධි පාඨමාලාවේ විශේෂ විෂය කේෂ්ත්‍ර වන්නේ කථන හා භාෂා චිකිස්සාව පාඨමාලාව සහ ශ්‍රවණාවේදයයි නමුත් ශ්‍රවණාවේදි විශේෂ උපාධි පාඨමාලව හැදෙරිය හැක්කේ අ.පො.ස (උ/පෙළ) සඳහා භෞතික විද්‍යා විෂය ධාරාව හැදෑරූ සිසුන්ට පමණී කලා විෂය ධාරාව හැදෑරූ අයට මෙහි කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව හෝ එහි විශේෂ උපාධි පාඨමාලාව වන කථන හා භාෂා චිකිස්සාව හැදෑරීමට බාධාවක් නැති
මෙම පාඨමාලාවට සුදුසුකම් ලබන දරුවන්ට තම ' අගය ඉහල මට්ටමක තිබිය යුතු වේ 2016 අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් මෙම පාඨමාලාවට සමත් වු දිවයුන පුරා සිසුන් ඒ සඳහා පවත්වා ගෙන තිබූ ' අගයන් වෙත දැන් යොමු වෙමු
කථන හා ශ්‍රවණ විද්‍යා උපාධි මාලාව
(කැලණි විශ්වවිද්‍යාලය)

- කොළඹ දිස්ත්‍රික්කය 1.7438
- ගම්පහ දිස්ත්‍රික්කය 1.7568
- කළුතර දිස්ත්‍රික්කය 1.7497
- මාතලේ දිස්ත්‍රික්කය 1.5895
- මහනුවර දිස්ත්‍රික්කය 1.6385
- නුවරඑළිය දිස්ත්‍රික්කය 1.5586
- ගාල්ල දිස්ත්‍රික්කය 1.7620
- මාතර දිස්ත්‍රික්කය 1.6904
- හම්බන්තොට දිස්ත්‍රික්කය 1.6997
- යාපනය දිස්ත්‍රික්කය 1.6139
- කිලිනොච්චිය දිස්ත්‍රික්කය 1.6177
- මන්නාරම දිස්ත්‍රික්කය 1.4344
- මුලතිව් දිස්ත්‍රික්කය 1.6947

- වව්නියාව දිස්ත්‍රික්කය 1.3909
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය 1.5809
- මඩකළපුව දිස්ත්‍රික්කය 1.6256
- අම්පාර දිස්ත්‍රික්කය 1.6527
- පුත්තලම දිස්ත්‍රික්කය 1.5958
- කුරුණෑගල දිස්ත්‍රික්කය 1.7225
- අනුරාධපුර දිස්ත්‍රික්කය 1.6471
- පොලොන්නරුව දිස්ත්‍රික්කය 1.4810
- බදුල්ල දිස්ත්‍රික්කය 1ග6920
- මොණරාගල දිස්ත්‍රික්කය 1.7563
- කෑගල්ල දිස්ත්‍රික්කය 1.7276
- රත්නපුර දිස්ත්‍රික්කය 1.7841

මේ ආකාරයට දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට අඩු හා වැඩි අගයන් පවත්වා ගනිමින් පැහැදිලි ලෙස ඉහල ' අගයක් අවශ්‍ය වේ
අද වන විට කලා විෂයයන් හදාරන සිසුන් අතර මෙම පාඨමාලාවට ඇති ඉල්ලුම වැඩි වී ඇත්තේ කලා විෂයධාරාව හැදෑරුවත් විද්‍යාවේදී උපාධියක් හිමි කර ගනිමින් වෛද්‍ය සිහිනය සැබෑ කර ගත හැකි නිසාවෙනී ඔබත් කලා විෂය ධාරාව හදාරයි නම් මේ ඔබටත් වෛද්‍ය සිහිනය සැබෑ කර ගත හැකි ආකාරයයි